# භර්තෘහරීගේ ශෘංගාරශතකයෙන් විද්‍යමාන වන ස්ත්‍රී ප්‍රයෝග පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

යූ. ඩබ්ලිව්. එන්. සුභාෂනී
කැලණිය විශ්වවිද්‍යාලය
nadeeshasuba1996@gmail.com

**සාරසංක්ෂේපය**

"ස්ත්‍රීන් කෙරෙන් පිළිබිඹු වන අත්‍යන්තයෙන් විනීත බව පෙන්වීම, ලැජ්ජාශීලී බව, ලලනෝපචාරී හැසිරීම් හා ආචාරශීලීභාවය ආදි ඉංගිතයෝ" ස්ත්‍රී ප්‍රයෝග ගණයෙහි ලා හැඳින්වෙති. පෙර'පර දෙදිග කවීහු ස්වකීය නිර්මාණයන්හි ස්ත්‍රී ස්වභාව පිළිබඳ නොයෙකුත් අර්ථකථන ලබාදීමෙහි උත්සාහගත් අයුරු ප්‍රකට වන්නේ ය. විශේෂයෙන් සංස්කෘත පද්‍ය සම්ප්‍රදායට අයත් නිර්මාණ කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ඒ බව පැහැදිලි වේ. පර්යේෂණයේ ගැටලුව වශයෙන් භර්තෘහරීගේ ශෘංගාර ශතකය ඔස්සේ කවරාකාර ස්ත්‍රී ප්‍රයෝග ප්‍රකට වන්නේ ද යන්න විමසා බැලේ. ඒ අනුව භර්තෘහරීගේ **ශෘංගාර ශතකය** කෙරෙහි අවධානය යොමු කරමින් ස්ත්‍රී ප්‍රයෝගයන්හි ස්වභාව පිළිබඳ විචාරයට ලක්කිරීම මේ පර්යේෂණයේ මූලික අරමුණ යි. ස්ත්‍රීත්වය වරෙක ගර්හාවට ලක් කිරීමත් වරෙක උත්කර්ෂයෙන් යුතු ව ලෝකයේ පැවැත්මට රුකුල් වන අයුරු කියා පෑමත් එකවර සිදුකිරීම ශෘංගාර ශතකයෙහි දක්නට ලැබේ. ශෘංගාර ශතකයෙහි නිරූපිත ස්ත්‍රී ප්‍රයෝග ආශ්‍රයෙන් ස්ත්‍රී ස්වභාව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ දී අපේක්ෂිත ය. ඒ අනුව ස්ත්‍රිය අනුකම්පා සහගතව මෙන් ම රාගික හැඟීම් උත්තේජනය කරවන්නියක ලෙස ද, තවත් විටෙක උත්කෘෂ්ට මනුෂ්‍ය ප්‍රාණියෙකු වශයෙන් සේ ම පිළිකුලෙන් යුතු ව බැහැර කළ යුතු සත්ත්වයෙකු වශයෙන් ද ශෘංගාර ශතකයෙහි විග්‍රහ කොට තිබෙනු නිරීක්ෂණය කළ හැකි ය. අධ්‍යයනයේ සීමා වශයෙන් මූලික ව ශෘංගාර ශතකයෙහි විද්‍යමාන වන ස්ත්‍රී ප්‍රයෝග කෙරෙහි පමණක් අවධානය යොමු කෙරේ. ගුණාත්මක පර්යේෂණ විධික්‍රමයට අනුව ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ග. ආරියපාල ගුණසේනගේ ශෘංගාර ශතකය සිංහල සංස්කරණය කෙරෙහි මූලික අවධානය යොමු කෙරේ. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් භාරතීය ආචාර්යවරුන්ගේ උපාධි නිබන්ධ හා උක්ත විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විරචිත ලේඛන පරිශීලනය කෙරේ. මේ දක්වා සිදුකොට ඇති පර්යේෂණ කෘති කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ඒවායින් ප්‍රමුඛ ව සාකච්ඡාවට ලක් ව ඇත්තේ භර්තෘහරීගේ ශතකත්‍රය හා කාව්‍ය රීති යනාදිය පිළිබඳ ව පමණි. එහෙත් මෙම පර්යේෂණයේ දී ස්ත්‍රී ප්‍රයෝගයන්හි සූක්ෂ්ම භාවිතයන් හා ඒවායෙහි ශෘංගාරාත්මක ප්‍රකාශන පිළිබඳ ව ද සාකච්ඡා කෙරෙන අතර, භර්තෘහරීන්ගේ ශෘංගාර ශතකයෙහි අධ්‍යයනයට ලක් නොවුණු ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමුකෙරෙන බව ද අවධාරණය කළ යුතු ය.

**ප්‍රමුඛ පදඃ** භර්තෘහරී, ශෘංගාර ශතකය, ස්ත්‍රී ප්‍රයෝග, ස්ත්‍රී ස්වභාව

# A Critical Study on Gimmicks (of Women) in Femininity on Sringara Sataka of Bharthrihari

U.W.N. Subashani
Department of Sinhala, University of kelaniya.
nadeeshasuba1996@gmail.com

## ABSTRACT

Showing extreme modesty, shyness, pampering behaviour, and politeness are referred to as gimmicks of femininity. It is known that the poets of both Western and Eastern traditions tried to give various interpretations of female nature in their works. This is especially evident when focusing on works belonging to the Sanskrit poetic tradition. As a research problem, the kinds of female Gimmicks that are evident through **Sringara sataka of Bharthrihari** will be examined. The purpose of this research is to criticise the nature of Gimmicks of femininity by focusing on Sringara Sataka of Bharthrihari. Femininity is sometimes despised and sometimes glorified as supporting the existence of the world. It is expected here to study the nature of women based on the Gimmicks mentioned in the Sringara Sataka. The woman who is prominent in the Sringara Sataka is sometimes seen as pitiable, a stimulant of lustful feelings, a sublime human being, and sometimes as a creature to be dismissed with contempt. As the limitations, only the feminine effects that are evident in the Sringara sataka of Bharthrihari will be focused on. According to the qualitative research methods, the Sinhala edition of Ariyapala Gunasena's Sringara sataka will be focused as the primary source. Under the secondary sources, the theses of Indian professors and selected documents related to the field are used. In the examination of postgraduate studies that have been conducted so far, only the research on **Sringara sataka of Bharthrihari** and poetical methods has been discussed. But it must be said this research discusses the subtle uses of feminine effects and their aesthetic manifestations. It can be indicated that this research will give opportunities for researchers to study the unseen fields **of Sringara sataka of Bharthrihari.**

**Keywords:** Bhathrihari, Femininity, Gimmicks, Sringara Sataka